PEACE

ecpat
Sri Lanka

# ළමා ලිංගික අපයෝජනය

## දැනුවත් කිරීමේ මාර්ගෝපදේශය



VicenteFerrer
Transforma la sociedad en humanidad

# ළමා ලිංගික අපයෝජනය
## දැනුවත් කිරීමේ මාර්ගෝපදේශය

පීස් / ECPAT ශ්‍රී ලංකා සංවිධානය (පරිසරය සහ සැමතැන වෙසෙන ළමුන් සුරැකීමේ සංවිධානය) මඟින් නිර්මිත, ළමා ලිංගික අපයෝජනය පිළිබඳ දැනුවත් කිරීමේ මාර්ගෝපදේශයට ඔබ සැම සාදරයෙන් පිළිගන්නෙමු. මෙම මාර්ගෝපදේශය දරුවන්ගේ අයිතීන් සුරැකීම උදෙසා දෙමාපියන්, ගුරුවරුන්, මාධ්‍ය වාර්තාකරුවන්, ප්‍රජා නායකයන් සහ තරුණයින් මෙන් ම දරුවන් සමඟ වැඩ කරන ඕනෑම අයෙකු සඳහා නිර්මාණය කර ඇත. මෙය ළමයින්ට එරෙහි ලිංගික අපයෝජන හඳුනා ගැනීම, වැළැක්වීම සහ ප්‍රතිචාර දැක්වීම සඳහා සෘජු, ප්‍රායෝගික පියවර ඉදිරිපත් කරයි. අර්ථවත් නිදර්ශන සහිතව මනා පැහැදිලි කිරීම් සමඟින් එක් එක් සංකල්පය පහසුවෙන් අවබෝධ කර ගනිමින් ඔබේ සමීපතමයන් සමඟ පහසුවෙන් බෙදා ගැනීමට හැකි වන ලෙස මෙම පොත සකසා ඇත.

දරුවන්ට එරෙහිව සිදුකරන ළමා ලිංගික සූරාකෑම සහ අපයෝජන නවතාලීමේ ව්‍යාපෘතිය යටතේ Fundación Vicente Ferrer විසින් අරමුදල් සපයන ලද මෙම මාර්ගෝපදේශ සංග්‍රහය ශ්‍රී ලංකාව පුරා පවත්වන්නා වූ දැනුවත් කිරීමේ වැඩසටහන්, වැඩමුළු, ප්‍රජා රැස්වීම් සහ අධ්‍යාපනික වැඩසටහන් සඳහා මාර්ගෝපදේශයක් ලෙස භාවිත කිරීමට අදහස් කෙරේ. ප්‍රජා රැස්වීමක් අතරතුර හෝ, පන්තිකාමර සාකච්ඡාවකට, ප්‍රවෘත්ති වාර්තාවක් ලිවීමේ දී හෝ, මෙහි දක්වා ඇති දැනුම සහ උදාහරණ ඔබට විශ්වාසයෙන් යුතුව භාවිත කළ හැක.

මෙම මාර්ගෝපදේශය අපගේ වටිනා පාර්ශ්වකරුවන් වන ඔබ සඳහා වේ. මෙය නොමිලේ මුද්‍රණය කළ හැකි මාර්ගෝපදේශ සංග්‍රහයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත. මෙය ඔබ ජීවත් වන ප්‍රජාව සමඟ බෙදා ගනිමින්, එය අවබෝධ කර ගනිමින්, ඔබ ප්‍රජාව තුළ ජීවත් වන දරුවන් ආරක්ෂා කිරීම සඳහා ප්‍රජාව බලගැන්වීමට මෙවලමක් ලෙස භාවිතා කරන්න.

# හැඳින්වීම

ළමා ලිංගික අපයෝජනය යනු දරුවාගේ අභිමානයට හානි කරන, ආරක්ෂාව



සහ මානව හිමිකම් කඩ කරන බරපතල ම ළමා අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමකි. ස්ත්‍රී පුරුෂභාවය, වයස, සමාජ ආර්ථික තත්ත්වය හෝ සංස්කෘතික පසුබිම නොතකා, සෑම තරාතිරමක ම, සෑම සමාජයක ම ළමා ලිංගික අපයෝජන සිදු වේ. මේ පිළිබඳ පුළුල් දැනුවත්භාවයක් තිබුණ ද, මෙම මාතෘකාව තවමත් සැඟවුණු, බහුලව කතාබහට ලක් නොවන මෙන්ම බොහෝ දරුවන් සහ වින්දිතයින් අපකීර්තියට පත් කරවන මාතෘකාවකි. එනිසා ඔවුන්ට අවශ්‍ය සහාය ද නොලැබී යයි.

ළමා ලිංගික අපයෝජනයේ යථා ස්වභාවය පිළිබඳව දෙමාපියන්, ගුරුවරුන්, භාරකරුවන් සහ ප්‍රජා සාමාජිකයින් දැනුවත් කිරීම සඳහා මෙම මාර්ගෝපදේශය සකස් කර ඇත. මිථ්‍යා මත දුරු කිරීම, දැනුවත් කිරීම සහ අපයෝජනයන් හඳුනා ගැනීමට, ඒවා වැළැක්වීමට සහ ඒවාට ප්‍රතිචාර දැක්වීම සඳහා පාඨකයන් දැනුමෙන් සන්නද්ධ කිරීම මෙහි අරමුණ යි. ගැටලුව පිළිබඳ පැහැදිලි සහ ප්‍රවේශ විය හැකි දළ විශ්ලේෂණයක් ඉදිරිපත් කිරීම සඳහා මෙහි අන්තර්ගතය, පර්යේෂණ, වින්දිතයින්ගේ අත්දැකීම් සහ ප්‍රායෝගික අත්දැකීම් මත පදනම් කොට ඇත.


මෙම මාර්ගෝපදේශය අවසානයේ, ළමා අයිතිවාසිකම් පිළිබඳව කටයුතු කරන සංවිධාන ලැයිස්තුවක් ඔබට ඉදිරිපත් කර ඇත. එම ආයතන හා සම්බන්ධ වෙමින් සාමූහික ප්‍රයත්නයක් හරහා ළමයින් සඳහා ආරක්ෂිත ලෝකයක් නිර්මාණය කිරීමට කටයුතු කරන ලෙස අපි ඔබෙන් ඉල්ලා සිටිමු.

# ළමා ලිංගික අපයෝජනය අවබෝධ කර ගනිමු

- ළමා ලිංගික අපයෝජනය යනු, යම් කෙනෙකුගේ ලිංගික තෘප්තිය සඳහා දරුවෙකු ඕනෑම ආකාරයකින් යොදා ගැනීමයි. එය ස්පර්ශයකින් හෝ ස්පර්ශයකින් තොරව සිදු විය හැක.

- ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවය ම ලිංගික අපයෝජන සිදු කරති. එම අපරාධකරුවන්, වැඩිහිටියන්, තරුණයින්, සමවයස් හෝ වැඩිහිටි දරුවන් විය හැකිය.

- ලිංගික අපයෝජනය දරුවාට කෙටිකාලීන හෝ දිගු කාලීන වශයෙන් දැඩි ශාරීරික, චිත්තවේගීය සහ මානසික බලපෑම් ඇති කරවයි.



# ළමා ලිංගික අපයෝජනය යනු කුමක්ද?

ළමා ලිංගික අපයෝජන සිදු වන්නේ දරුවෙකුට නිසි අවබෝධයක් නොමැති සහ කැමැත්ත ලබා දීමට හැකියාවක් නොමැති ලිංගික ක්‍රියාකාරකම්වල ඔහුව හෝ ඇයව යොදවා ගැනීමෙනි. ළමයෙකු රැවටීම, බලහත්කාරකම් කිරීම, පෙලඹවීම හෝ ලිංගික හැසිරීම්වලට බල කිරීම වැනි ක්‍රියා එයට ඇතුළත් වේ. මෙයට ස්පර්ශ කිරීම හෝ ලිංගික ප්‍රවේශය වැනි ශාරීරික ක්‍රියා ඇතුළත් විය හැකි අතර, ලිංගිකමය අදහස් සහිත අන්තර්ගතයන්ට දරුවා නිරාවරණය කිරීම, අසභ්‍ය දර්ශන නැරඹීමට දරුවා පෙලඹවීම හෝ අන්තර්ජාලය භාවිතයෙන් සිදුකරන ළමා ලිංගික සූරාකෑම වැනි ශාරීරික නොවන ක්‍රියාකාරකම් ද ඇතුළත් විය හැකිය.



ළමා ලිංගික අපයෝජනයට සෑමවිට ම ප්‍රචණ්ඩත්වය හෝ බලහත්කාරය ඇතුළත් නොවේ. දරුවා නිදා සිටින අවස්ථාවක, මත්ද්‍රව්‍ය ලබා දී පියවි සිහිය නොමැති අවස්ථාවක හෝ ව්‍යාජ සෙනෙහසක් දැක්වීම, තර්ජනය කිරීම හෝ අල්ලස් ලබා දීම මගින් පෙලඹවීමක් ඇති කළ හැකි අවස්ථා මෙන් ම, ළමයා අවදානමට ලක්විය හැකි හෝ අන්‍යයන්ගෙන් යැපෙන අවස්ථාවන්හිදී ද ළමා අපයෝජනය සිදුවිය හැක.

ළමා අපයෝජනවල දී බොහෝ විට බල අසමතුලිතතාවයක් දක්නට ලැබේ. (ඕනෑම අයෙකු විසින් කුඩා දරුවෙකුගේ විශ්වාසය හෝ අවනතභාවය අයථා පරිදි උපයෝගී කරගන්නා අවස්ථාවල දී)

ළමා ලිංගික අපයෝජනය යනු කුමක්ද? - ළමයෙකුට එරෙහිව සිදු කරන ලද හානිදායක ක්‍රියා මීට ඇතුළත් වේ. වයස, අවබෝධය හෝ වර්ධනය හේතුවෙන් එකඟතාව දැක්වීමට හැකියාවක් නොමැති දරුවෙකුට සිදු කරන ඕනෑම ලිංගික ක්‍රියාකාරකමක් මීට ඇතුළත් වේ.

# ළමා ලිංගික අපයෝජනය වරදක් වන්නේ ඇයි?

ළමා ලිංගික අපයෝජනයකදී ළමා අයිතිවාසිකම් සහ ස්වාධිපත්‍ය බරපතල ලෙස උල්ලංඝනය වේ. ළමයින් කායික, චිත්තවේගීය, සමාජීය සහ බුද්ධිමය වශයෙන් ලිංගික අත්දැකීම් සඳහා සූදානම් නැත. විශේෂයෙන්ම වැඩිහිටියන් සමඟ එවැනි සම්බන්ධතා සඳහා ඔවුන්ගේ මනස සහ ශරීරය වර්ධනය වී නොමැත. සෑම දරුවෙකුට ම ශාරීරික ස්වාධීනත්වයක් සඳහා අයිතියක් ඇත. එනම් ඔවුන් ස්පර්ශ කළ හැක්කේ කාටද, කවදා ද සහ කෙසේ ද යන්න තීරණය කිරීමට ඇති අයිතිය යි. නමුත් දරුවන් අපයෝජනයට ලක්කිරීම, ඔවුන්ගේ එම අයිතිය උදුරා ගැනීමකි.

දරුවන් අපයෝජනය 'වින්දනය' කරන බවත් එය හානිදායක නොවන බවත් අපයෝජකයන් විසින් තමන්ට ඒත්තු ගන්වා ගත්ත ද, පර්යේෂණ මඟින් එය එසේ නො බව පෙන්වා දී ඇත. අපයෝජනයේ ප්‍රතිවිපාක සෑමවිටම බරපතල වන අතර බොහෝ විට ඒවා දිගුකාලීන වේ.



# ළමා ලිංගික අපයෝජනයේ බලපෑම

ළමා ලිංගික අපයෝජනයට ලක් වූ වින්දිතයින්:

- විෂාදය හා කාංසාව
- වරදකාරී හැඟීම්, ලැජ්ජාව සහ ස්වයංවිවේචනය
- අතීත මතකයන් සහ බියකරු සිහින ඇතුළු පශ්චාත් කම්පන ආතති ආබාධ (PTSD)
- අඩු ආත්ම අභිමානය සහ ස්වයංවෛරය
- ලිංගික ව්‍යාකූලත්වය හෝ ලිංගික සබඳතාවල දුෂ්කරතා
- අවදානම් හැසිරීම් (උදා: මත්ද්‍රව්‍ය භාවිතය, අනාරක්ෂිත ලිංගික හැසිරීම)
- විශ්වාසනීය සබඳතා ගොඩනැගීමේ දුෂ්කරතා
- ඉගෙනීමේ ගැටළු හෝ පාසල් මඟහැරීම
- සියදිවි නසාගැනීමේ සිතුවිලි හෝ ස්වයංහානිය
- වැඩිහිටිවියේ දී මිනිස් වෙළඳාම, ගණිකා වෘත්තිය සහ අනිසි සබඳතා ඇතුළු තවත් සූරාකෑම්වලට ගොදුරු වීම.



# ළමා ලිංගික අපයෝජන සිදු කරන්නේ කවුද?

බොහෝ අවස්ථාවන්හී දී, අපයෝජකයා දරුවා දන්නා සහ විශ්වාස කරන අයෙකි. බොහෝ විට ඥාතියෙකු, පවුලේ මිතුරෙකු, ගුරුවරයෙකු හෝ බල සම්පන්න වැඩිහිටියෙකු, මිතුරෙකු හෝ අසල්වැසියෙකු විය හැකිය. අපයෝජකයින් බහුලව පිරිමින්, කාන්තාවන්, සම වයස් හෝ වැඩිහිටි දරුවන් විය හැකිය. මේ අතරින් බහුතරයක් වැඩිහිටි පිරිමි වන අතර, කාන්තා අපයෝජකයින් සහ යොවුන් වියේ අපයෝජකයින් ද සිටිති.



බොහෝ අපයෝජකයෝ චිත්තවේගීය නොමේරූ (අපරිණත), ලිංගිකත්වය පිළිබඳ විකෘති අදහස් හෝ අතීත කම්පනයන් සමඟ ජීවත්වන පුද්ගලයන් වේ. සමහර අපයෝජකයින්  අතීතයේදී අපයෝජනයට ගොදුරු වූ අය වුවද, බොහෝ වින්දිතයින් අන් අයව අපයෝජනය කිරීමට නොයති.

අපයෝජකයෝ බොහෝ විට තම ක්‍රියාවන් සාධාරණීකරණය කරති. දරුවා එය ආරම්භ කළ බව හෝ එය දරුවාට සතුටුදායක අත්දැකීමක් කිරීමට අදහස් කළ බව පවසති. නමුත් එවැනි සාධාරණීකරණයන්ගෙන් හානිය හෝ වගකීම අඩු නොවන අතර, බාහිර මැදිහත්වීමෙන් එය නතර වන තුරු ම අපයෝජනය දිගට ම සිදුවේ.

# ළමා ලිංගික අපයෝජන වර්ග



## අවස්ථානුකූල වැරදිකරුවන්

මොවුන්ට දරුවන් කෙරෙහි මූලික ලිංගික උනන්දුවක් නොමැති වුවද ආතතිය, මත්ද්‍රව්‍ය භාවිතය හෝ වැඩිහිටි ලිංගික සමීපත්වය නැතිවීම වැනි විශේෂිත තත්වයන් යටතේ වැරදි සිදු කරනු ඇත. මෙම වරද බොහෝවිට අවස්ථානුකූල වේ.



## අභිප්‍රේත වැරදිකරුවන්

දරුවන් කෙරෙහි දිගුකාලීන, සුවිශේෂී ලිංගික උනන්දුවක් ඇති අය වෙති. මොවුහු දරුවන් ඔවුන්ගේ සහකරුවන් ලෙස සලකති. මොවුන්ට බොහෝ විට වැඩිහිටි ලිංගික සමීපතාවයන් නොමැති අතර සමාජීය වශයෙන් හුදකලා අය විය හැකිය.



## ප්‍රතිෂ්ඨාපිත වැරදිකරුවන් (කෞමාර කාමුකයින්)

ඔවුහු දරුවන් කෙරෙහි ලිංගික ආකර්ෂණයක් පෙන්නුම් කරති. (මෙය සායනික මනෝ චිකිත්සාවට අනුව 'කෞමාර කාමුක ආබාධය' ලෙස සලකයි). මොවුහු පුළුල් ලෙස සැලසුම් කරමින් සහ ලිංගික පෙලඹවීම් කරමින් දරුවන් අපයෝජනය කරනු ලබති.

# මත්පැන් සහ මත්ද්‍රව්‍යවල භූමිකාව



මත්පැන්,මත්ද්‍රව්‍ය භාවිතා කිරිමෙන් මිනිසුන්ගේ පාලනය සහ සිහිය නොමැති විය හැකිය.මෙවැනි අවස්ථාවලදී පුද්ගලයන් තම ආවේග මත පාලනයෙන් තොරව ක්‍රියාත්මක වේ. එහි ප්‍රතිඵල ලෙස ව්‍යාභිචාරය හෝ විවිධාකාරයේ අවස්ථානුකූල අපයෝජනවලට මඟ පාදයි. නමුත් මත්ද්‍රව්‍ය භාවිතය කිසිවිටෙකත් අපයෝජන සාධාරණීකරණය කිරීමට හේතුවක් නොවේ.

# ප්‍රචණ්ඩකාරී ලිංගික අපයෝජන (ළමා දූෂණ)



සමහර අපරාධකරුවෝ පෙලඹවීමට වඩා බලහත්කාරය හෝ තර්ජන භාවිත කරති. ඔවුන්ගේ චේතනාවන් විය හැක්කේ:

- කෝපය: අන් අයට හානි කිරීමෙන් තම කෝපය පළ කිරීම
- බලය: ආධිපත්‍යය සහ පාලනය තහවුරු කිරීම
- පරපීඩා කාමුකත්වය: අන් අයට වේදනාව ලබා දීමෙන් සතුටක් ලබා ගැනීම (දුර්ලභ වුවද අන්තරාදායක වේ)

# අන්තර්ජාලය ඔස්සේ සිදුකරන ළමා ලිංගික අපයෝජන



අන්තර්ජාල භාවිතය වැඩි වීමත් සමඟම දරුවන් අන්තර්ජාලයේ සැරිසරන අපයෝජකයන්ට ගොදුරු වීමේ අවදානම වැඩි වී ඇත. මෙම අපයෝජකයින් බොහෝවිට සමවයස් මිතුරන් ලෙස පෙනී සිටිය හැක. මොවුහු කතාබහ හෝ සමාජ මාධ්‍ය හරහා ළමයින් ලිංගික පෙලඹවීම්වලට සහ අසභ්‍ය අන්තර්ගතයන් බෙදා ගැනීමට පොළඹවා ගනිති. මෙය හිරිහැර කිරීම්, ලිංගික ග්‍රහණය, ළමා ලිංගික ජාවාරම්, හෝ සජීවී ලිංගික අපයෝජනවලට හේතු විය හැක.

අපයෝජකයෝ බොහෝ විට ළමා ලිංගික අපයෝජන අන්තර්ගතයන් අන්තර්ජාලය හරහා හුවමාරු කර ගැනීමටත්, නීතියට හසු වීම වැළැක්වීම සඳහා උපක්‍රම ද බෙදා ගනිති. ඇතැම් විට පවුලේ සාමාජිකයන් විසින් ම මුදල් සඳහා වෙබ් කැමරා හරහා ළමයින් සූරාකෑමෙහි යොදවා ඇත.

වැළැක්වීමේ පියවර:

- අන්තර්ජාල ආරක්ෂාව ගැන දරුවන් සමඟ විවෘතව කතා කරන්න.
- සමාජ මාධ්‍ය ක්‍රියාකාරකම් සහ යෙදුම් (Apps) නිරීක්ෂණය කරන්න.
- මාපිය පාලන ක්‍රම සහ පෙරහන් (filters) භාවිතා කරන්න.
- කිසිවිටෙකත් අසභ්‍ය ඡායාරූප/වීඩියෝ බෙදා නොගැනීමට උගන්වන්න.
- මාධ්‍ය මෙවලම් හරහා අදාළ බලධාරීන්ට වාර්තා කරන්න.

# දරුවන් විසින් දරුවන්ට සිදු කරන අපයෝජන



ලිංගික අපයෝජන දරුවන් ද සිදු කළ හැකිය. එය බොහෝ විට නව යොවුන්වියේ දී හෝ ඊට පෙර සිට ම ආරම්භ විය හැකිය. පොදු පුද්ගල ආකෘති හතක් මීට ඇතුළත් වේ:

- බොළඳ අත්හදා බැලීම් කරන්නන් - කුතුහලය නිසා, හානිය ගැන අවබෝධයක් නැති අය
- සමාජශීලී නොවූ සූරාකන්නන් - හුදකලා වූ, පාලනයක් සොයන්නන්
- සමාජගත වූ ව්‍යාජ සූරාකන්නන් - හොඳින් හැඩගැසුණු විනෝදය සඳහා අපයෝජන කරන්නන්
- ලිංගික ආක්‍රමණශීලී තරුණයින් - ප්‍රචණ්ඩ ලිංගික ඉතිහාසයක් හෝ අක්‍රමවත් පවුල් පසුබිමකින් පැමිණෙන දරුවන්
- ලිංගික බලකිරීම්/අක්‍රමතා සහිත අය- කාංසාව හෝ උමතුව නිසා සිදුකරන
- විපරිත ආවේගශීලී පුද්ගලයින් - මානසිකව හෝ චිත්තවේගීය වශයෙන් අස්ථායී අය
- කණ්ඩායම් බලපෑම් සහිත අය - මිතුරන්ගේ පීඩනය යටතේ හෝ කණ්ඩායමේ පිළිගැනීම සඳහා ක්‍රියා කරන අය


වැඩිදුර හානිය වැළැක්වීම සහ මොවුන්ගේ සෞඛ්‍ය සම්පන්න සංවර්ධනයට සහාය වීම සඳහා මැදිහත්වීම සහ ප්‍රතිකාර ඉතා වැදගත් වේ.

# අවදානමේ සිටින දරුවන් කවුද?

පසුබිම කුමක් වුවත්, ළමා ලිංගික අපයෝජනය ඕනෑම දරුවෙකුට සිදුවිය හැක. කෙසේ වෙතත්, සමහර සාධක මෙම අවදානම වැඩි කරයි:

- ජීව විද්‍යාත්මක දෙමාපියෙකු, විශේෂයෙන් පියෙකු නොමැතිව ජීවත් වීම
- සීමිත අධීක්ෂණයක් සහිත ගෘහයක වාසය කිරීම
- පවුල් ගැටුම් හෝ නොසලකා හැරීම් අත්විඳීම
- අඩු ආත්ම අභිමානය හෝ චිත්තවේගීය අවශ්‍යතා තිබීම
- සුළු පියා සමඟ ජීවත් වීම (ගැහැණු ළමයින් සඳහා වැඩි අවදානමක්)
- දිළිඳු හෝ අනාරක්ෂිත නිවාසවලින් පැමිණීම (පිරිමි ළමයින් සඳහා වැඩි අවදානමක් ඇත)

මොවුහු අස්ථිර හෝ සමාජයෙන් කොන් වූ පරිසරවල ජීවත් වන දරුවන් වෙති. මොවුහු පෙලඹවීම් සහ අපයෝජනයට වැඩි වශයෙන් ගොදුරු වෙති.



# දරුවන් අපයෝජන වාර්තා නොකරන්නේ ඇයි?

බොහෝ දරුවන් නිහඬව සිටින්නේ:

- එය අපයෝජනයක් බව ඔවුන්ට වැටහීමක් නොමැති වීම
- වැඩිහිටියන්ට කීකරු වීමට ඔවුන්ට උගන්වා තිබීම
- ඔවුන් දඬුවමට හෝ දෝෂාරෝපණයට බිය වීම
- පවුලට සිදුවිය හැකි ප්‍රතිවිපාක ගැන බිය වීම
- අපයෝජකයාගේ තර්ජනයට ලක් වී සිටීම
- තෑගි හෝ පෙර නොලැබූ සෙනෙහසක් ලැබීම සහ ගැටුම්කාරී හැඟීමක් දැනීම
- ලැජ්ජාවක් දැනීම හෝ තමන්ට ම දොස් පවරා ගැනීම


දරුවන් හෙළි කිරීමට උත්සාහ කළ ද, බොහෝ වැඩිහිටියෝ ඔවුන්ව අවිශ්වාස කිරීම හෝ නොසලකා හරිති. එබැවින් වැඩිහිටියන් විසින් දරුවන්ට කතා කිරීමට ආරක්ෂිත අවකාශයන් ලබා දෙමින් ඔවුන්ගේ හෙළිදරව් කිරීම් බැරෑරුම් ලෙස සැලකීම ඉතා වැදගත් වේ.



# අපයෝජනයේ සලකුණු හඳුනා ගැනීම

ළමා ලිංගික අපයෝජනයේ සලකුණු බොහෝ විට ශාරීරික වීමට වඩා චර්යාත්මක වේ.

- පසුගාමී හෝ ආක්‍රමණශීලී වීම
- නපුරු සිහින දැකීම හෝ ඇඳ තෙත් කිරීම
- ඇතැම් පුද්ගලයන්ට ඇති බිය
- පැහැදිලි කළ නොහැකි වේදනාවන් හෝ ලේ ගැලීම්
- මනා ලිංගික දැනුමක් තිබීම
- මානසික අවපීඩනය හෝ ස්වයං හානිය
- අධ්‍යාපන කටයුතු මඟ හැරීම හෝ නිවසෙන් පලා යාම
- ආහාර ගැනීමේ හෝ නින්දේ බාධා




ප්‍රබලතම දර්ශකවලින් එකක් වන්නේ දරුවාගේ වයසට නුසුදුසු ලිංගික හැසිරීම යි.

# අපයෝජනය සක්‍රීය කරන කොන්දේසි හතර

1. අභිප්‍රේරණය: අපයෝජකයාට දරුවන් කෙරෙහි ලිංගික උනන්දුවක් තිබීම
2. බාධාවන් ජය ගැනීම (නිශේධනය): අපයෝජකයා සදාචාරාත්මක බාධක අවම කරගනී (බොහෝ විට මත්පැන්, මත්ද්‍රව්‍ය හෝ අසභ්‍ය දර්ශන මේ සඳහා භාවිතා කරයි)
3. අවස්ථාව: දරුවාව තනි කරගැනීමට ඇති අවකාශය
4. විරෝධය ජය ගැනීම: දරුවාගෙන් ඇතිවන විරෝධය පාලනය කිරීමට භාවිතා කරන පෙලඹවීම්, තර්ජන හෝ අල්ලස්.

මින් ඕනෑම එක් කොන්දේසියක් හෝ ඉවත් කළහොත් අපයෝජනයක් සිදු වීමට ඇති ඉඩකඩ අඩු වේ.



# වැළැක්වීම



- මහජනයා දැනුවත් කිරීම: අපයෝජනය වැරදි සහ හානිදායක බව අවබෝධ කරවාලීම.
- අවදානම් සහිත පුද්ගලයන් සඳහා සහාය ලබා දීම: හානියක් සිදුවීමට පෙර අවදානමට ලක්විය හැකි අයගේ රහස්‍යභාවය සුරකිමින් අවශ්‍ය උපකාර ලබා දෙන්න.
- ශක්තිමත් නීති පැනවීම සහ බලාත්මක කිරීම: ළමා ලිංගික අපයෝජනය සාපරාධී කිරීම සහ නිසි දඬුවම් සහතික කරන්න.
- ආරක්ෂිත පරිසරයන්: අධීක්ෂණයකින් තොරව පාසල්වල, නිවාසවල සහ ආයතනවල සිටින දරුවන් හමුවිය හැකි අවස්ථා අවම කරන්න.
- අධ්‍යාපනය: දරුවන්ට ශරීර ආරක්ෂාව, කැමැත්ත ලබා දීම, නුසුදුසු ස්පර්ශයට 'එපා' කියන්නේ කෙසේද? යනාදිය ඉගැන්වීම.
- දෙමාපියන්ගේ සහභාගීත්වය: ඔබේ දරුවා කාලය ගතකරන්නේ කවුරු සමඟ ද? යන්න දැනගන්න. ඔවුන්ගේ ගැටළුවලට සවන් දෙන්න.

# සමාජ සාධක


ළමා ලිංගික අපයෝජනය වර්ධනය වන්නේ:

- දැඩි බල ධුරාවලියක් සහිත පිතෘමූලික සමාජවල
- දුර්වල ළමා ආරක්ෂණ නීති සහිත සංස්කෘතීන්වල
- පුළුල්ව පැතිරුණු අසමානතා සහ ගැටුම් සහිත ප්‍රජාවන් අතර
- දරිද්‍රතාවය, අවතැන්වීම හෝ ස්වභාවික ව්‍යසන තත්වයන් හේතුවෙන්
- ලිංගික අධ්‍යාපනය හෝ ළමා අයිතිවාසිකම් පිළිබඳ දැනුවත්භාවය නොමැති පරිසරවල

මෙනිසා සමාජ ආකල්ප වෙනස් කිරීම සහ යුක්තිය, අධ්‍යාපනය සහ ප්‍රජා සහයෝගය වැඩි දියුණු කිරීම අත්‍යවශ්‍ය වේ.



# හොඳ ස්පර්ශය සහ නරක ස්පර්ශය




## හොඳ ස්පර්ශය

- ඔබ දුකෙන් සිටින විට හෝ සතුටින් සිටින විට ඔබේ මව හෝ පියා ඔබව වැළඳ ගැනීම
- ඔබ පන්තියේ දී දක්ෂතා පෙන්වූ විට ඔබේ ගුරුවරයා අතට අත දීම
- ආරක්ෂිතව පාර මාරුවීමට අත් අල්ලාගැනීම
- 'හොඳයි' කීමට පිටට මෘදු තට්ටුවක් දීම
- වෛද්‍යවරයෙක් ඔබේ සෞඛ්‍යය සඳහා ඔබේ මව ඉදිරියේ ඔබව පරීක්ෂා කිරීම

## නරක ස්පර්ශය

- ඔබේ පපුව, ලිංගික අවයව හෝ තට්ටම් ස්පර්ශ කිරීම හෝ පිරිමැදීම
- වෙනත් කෙනෙකුගේ රහස්‍ය කොටස් ස්පර්ශ කිරීමට ඔබට බල කිරීම
- ඔබේ ඇඳුමින් වැසුණු ප්‍රදේශ බැලීමට උත්සාහ කිරීම හෝ සිරුර නිරාවරණය වන ආකාරයෙන් ක්‍රීඩා කිරීමට උත්සාහ කිරීම
- ඔබට බියක්, ලැජ්ජාවක් හෝ අපහසුවක් දැනෙන ඕනෑම ස්පර්ශයක්

# දුටුවහොත් - දැනුම් දෙන්න - නවත්වන්න

යම් කෙනෙකුගේ ක්‍රියාවක් ගැන ඔවුන්ට අපහසුතාවයක් දැනෙන විට පහත උපදෙස් අනුගමනය කිරීමට දරුවන්ට උගන්වන්න...




### හයියෙන් සහ ශබ්ද නඟා 'එපා!' කියන්න

එම හැසිරීම පිළිගත නොහැකි බව පුද්ගලයාට දැන ගැනීමට සහ අවට සිටින ඕනෑම අයෙකුගේ අවධානය ලබා ගැනීමට ශබ්ද නඟා, ශක්තිමත්, පැහැදිලි හඬකින් කතා කරන්න.

### තව කවුරුහරි ඉන්න ආරක්ෂිත ස්ථානයකට ඉක්මනින් 'යන්න'

ඔබ තනි නොවන සේ, ගුරුවරුන්, මිතුරන්, හෝ වැඩිහිටියන් සිටින ඔබට ආරක්ෂිත යැයි හැඟෙන ප්‍රදේශයකට ඉක්මනින් යන්න.

### ඔබ විශ්වාස කරන වැඩිහිටියෙක්ට 'කියන්න'

ඔබ ගැන සැලකිලිමත් වන ඔබ දන්නා කෙනෙකු, දෙමාපියෙකු, ගුරුවරයෙකු, පුහුණුකරුවෙකු හෝ අසල්වැසියෙකු සොයා ගෙන ඔවුන්ට ඔබට සහාය වීමට හැකි වන පරිදි සිදු වූ දේ හරියට ම පැහැදිලි කරන්න.

# ළමා අපයෝජන වාර්තා කරන්න

## ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

අපයෝජනය වාර්තා කිරීමට අමතන්න **1929**

## පොලිස් ළමා හා කාන්තා කාර්යාංශය



අපයෝජනය වාර්තා කිරීමට අමතන්න **109**


## PEaCE / ECPAT Sri Lanka

PEaCE ecpat Sri Lanka




අපයෝජනය වාර්තා කිරීමට අමතන්න
**071 273 3037**

# ප්‍රජා ප්‍රතිචාරය




දරුවන්ගේ ආරක්ෂාව සහතික කිරීම සමස්ත ප්‍රජාවගේ ම වගකීමකි. අසල්වාසීන්, ගුරුවරුන්, සාප්පු හිමියන්, ආගමික නායකයන් සහ මිතුරන් යන සියල්ලෝ ම දරුවෙකුගේ යහපැවැත්ම ගැන විමසිල්ලෙන් සිටින විට, ඔවුන්ට ළමා අපයෝජන පිළිබඳ අනතුරු ඇඟවීමේ සලකුණු කල්තියා හඳුනා ගැනීමටත්, අපයෝජනය වාර්තා කිරීමටත්, හානියක් වීමට පෙර උපකාර කිරීමටත් හැකිය. සැමදෙනාගේම දරුවන් ආරක්ෂා කිරිමෙන්, තොරතුරු බෙදාගැනීමෙන් සහ එකට එක්ව ක්‍රියා කිරීමෙන් ප්‍රජාව තුළ ආරක්ෂක කවයක් ගොඩනැගෙන අතර, එමඟින් ළමා අපයෝජනය සමාජයේ අවධානයට සහ අභියෝගයට ලක්වේ. අප සියලු දෙනා ම තනි තනිව වගවන විට, “සෑම දරුවෙකුට ම රැකවරණය, ගෞරවය සහ ආරක්ෂාව අවශ්‍යයයි“ යන පැහැදිලි පණිවිඩය සාමාජය වෙත ලබාදිය හැකිය.

# ළමා ලිංගික අපයෝජන වැළැක්වීම




**ශරීර සීමාවන් උගන්වන්න:** දරුවන්ට ඔවුන්ගේ ශරීරයේ කුමන කොටස් පුද්ගලික ද යන්න සහ කිසිවෙකු අවසරයකින් තොරව ඒවා ස්පර්ශ නොකළ යුතු බව පැහැදිලි කරන්න.

**විවෘත සන්නිවේදනය දිරිමත් කරන්න:** දරුවන්ට අපහසුතාවයක් හෝ බියක් දැනෙන ඕනෑම දෙයක් ගැන ඔබට සැමවිට ම කතා කළ හැකි බව දරුවන්ට දන්වන්න.

**ඔවුන්ගේ මිතුරන් අධීක්ෂණය කරන්න සහ දැන ගන්න:** ඔබේ දරුවා අන්තර්ජාලය ඔස්සේ සහ අනෙක් අවස්ථාවල කාලය ගත කරන්නේ කවුරුන් සමඟ ද සහ ඔවුන් යන ස්ථාන පිළිබඳව විමසිල්ලෙන් සිටින්න

**'ආරක්ෂිත' සහ 'අනාරක්ෂිත' ලැයිස්තු භාවිතා කරන්න:** 'වැරදි' හෝ 'අමුතු' ලෙස හැඟෙන තත්වයන් සහ ආරක්ෂිත වැඩිහිටියන් සහ ස්ථාන (උදා: පාසල, පොලිස් නිලධාරීන්) හඳුනා ගැනීමට දරුවන්ට උපකාර කරන්න.

**දරුවන්ගේ සහජ බුද්ධිය විශ්වාස කරන්න:** යමක් නිවැරදි යැයි හැඟෙන්නේ නැත්නම්, එය කවුරුන් වුවද 'එපා' යැයි පවසා පිටව යාමට ඔවුන්ට අයිතියක් ඇති බව දරුවන්ට මතක් කර දෙන්න.

**වහාම වාර්තා කරන්න:** දරුවකු ගැටළු බෙදා ගන්නේ නම් හෝ අනතුරු ඇඟවීමේ සංඥා දුටුවහොත්, ප්‍රමාදයකින් තොරව නිසි බලධාරීන්ට (උදා: ක්ෂණික ඇමතුම් අංකය; ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය -1929 හෝ පොලිස් ළමා හා කාන්තා කාර්යාංශය -109) වාර්තා කරන්න.

දරුවන් අපේ උතුම් ම සම්පත යි. ඔවුන් ලිංගික අපයෝජනවලින් ආරක්ෂා කිරීම දෙමාපියන්ගේ, ගුරුවරුන්ගේ, භාරකරුවන්ගේ, රජයේ හා සමස්ත ප්‍රජාවගේම එක හා සමාන පොදු යුතුකමකි. සෑම දරුවෙකුට ම ආරක්ෂිතව, ගෞරවයෙන් හා ආදරයෙන් වැඩීමට අයිතියක් ඇත. එක්ව, එම අයිතිය යථාර්ථයක් වන ලෝකයක් ගොඩනඟමු.

PEACE

VicenteFerrer
Transforma la sociedad en humanidad

ecpat
Sri Lanka